# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,399 — 1962 නොවැම්බර් 23 වැනි සිකුරාදා — 1962.11.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# V කොටස — කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම්පත් ලැයිස්තුව

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)

## වර්ෂ 1951 කේ අංක 14 දරන මෝටර් රථ පනත

### කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසර පතක් ඉල්ලීමේ අයදුම් පත

වර්ෂ 1951 කේ අංක 14 දරන මෝටර් රථ පනතෙහි 37 වන ඡේදය යටතේ කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙන යාමේ අවසර පතක් ලබා ගැනීම පිණිස, මා වෙත ඉදිරිපත් කරන ලද අයදුම් පතක් යෝජිත මාර්ගවල හා ඊට තදසන්නව දනට ගමනාගමන පහසුකම් සලසන්නවුන්ගේ හෝ. යෝජිත මාර්ග හෝ ඒවායින් කොටසක් තමන්ගේ පාලන මායිම් වලට අසුවන පළාත් පාලන ආයතනයන්ගේ හෝ දනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

මෙම අයදුම්පත පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට අදහස් කරන අයකු හෝ පළාත් පාලන ආයතනයක් හෝ වර්ෂ 1962 දෙසැම්බර් මස 10 වැනි දිනට ප්‍රථම මා වෙත ලියා දන්විය යුතුය. එවැනි සෑම ලියවිල්ලකම, පිටපත් දෙකක් එවිය යුතු අතර, (1) ඉල්ලුම් පත්‍රයේ අනුක්‍රමික අංකය, (2) අයදුම්කරුගේ නම සහ ලිපිනය සහ (3) යෝජිත මාර්ගය ද සඳහන් කළ යුතුය.

පී. කාසිලිංගම,
වැ. බ. මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්.

1962 නොවැම්බර් මස 14 වැනි දින.

| අයදුම් පත ලැබුණු දිනය | අනුක්‍රමික අංකය | අයදුම්කරුගේ නම සහ ලිපිනය | යෝජිත මාර්ගය | සේවාවන් පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 1962.10.20. | ... ඒ. බී. 2098 ... | ටී. පී. පෙරේරා මහතා, කොත ලාවල, කඩුවෙල | හතරමං හන්දිය, කොට්ටාව හන්දිය, මත්තෙගොඩ හන්දිය සහ සියඹලාගොඩ හරහා තැබෑරුම හන්දියේ සිට පොල්ගස්ඕවිට හන්දිය දක්වා | දනට පවත්වාගෙන යන සේවාවක බලපත්‍රය අළුත් කිරීම |

11–951/1

---

## වර්ෂ 1951 කේ අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනත

### කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසර පතක් ඉල්ලීමේ අයදුම් පත

වර්ෂ 1951 කේ අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහණ පණතෙහි 87 (4) දරන ඡේදය අනුව, කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම උදෙසා මගීන් ගෙන යාමේ බලපතක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති පහත දක්වෙන අයදුම්පත සම්බන්ධව වර්ෂ 1962 කේ දෙසැම්බර් මස 8 වැනි දින පෙ. ව. 10 ට කොළඹ මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් කාර්යාලයේ දී ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්වෙන බැව් මෙයින් නිවේදනය කරමි. .

2. ඉහත දක්වෙන බලපත්‍රය නිකුත් කිරීම ගැන නීත්‍යානුකූලව විරෝධය පළකොට ඇති අයවළුන් සහ අයදුම්කරු හැර අන්කිසිවෙකු හට ප්‍රසිද්ධ පරීක්ෂණයකදී කරුණු ඉදිරිපත් කිරීමට අයිතියක් නැත.

3. එහෙත් කොමසාරිස් තැනට ස්වකීය අභිමතය පරිදි ඉහත (2) වන ඡේදයෙහි සඳහන් ඕනෑම කෙනෙකු හට ප්‍රසිද්ධ පරීක්ෂණයකදී කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ සැලසිය හැක.

9—බී 47164— 675 (62/11)

4. යම්කිසි පුද්ගලයකුගේ අදහස් වෙනයම් පුද්ගලයකු විසින් එම පරීක්ෂණයේදීම ඉදිරිපත් කොට ඇතැයි කොමසාරිස් තැනට ඒත්තු ගියහොත් ස්වකීය අභිමතය පරිදි එවැනි ඕනෑම පුද්ගලයකුගෙන් කරුණු ඇසීම කොමසාරිස් තැනට ප්‍රතික්ෂෙප කළ හැක.

පී. කාසිලිංගම්,
වැ. බ. මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්.

1962 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 5,
මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ දී ය.

| අනුක්‍රමික අංකය | අයදුම්කරුගේ නම සහ ලිපිනය | යෝජිත මාර්ගය | සේවාවන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| ඒ. බී. 2097 ... | කේ. කේ. ටාඩ්‍යර් ද සිල්වා, ලේකම්තැන, සීමාසහිත කොලොන්න ට්‍රාන්ස්පෝට් සමාගම, අංක 328, සූරියකන්ද පාර, කොලොන්න | ඇඹිලිපිටිය, පනාමුරේ සහ කොලොන්න හරහා සූරියකන්දේ සිට ඇඹිලිපිටිය දක්වා | දිනට පවත්වාගෙන යන සේවාවක බලපත්‍රය අළුත් කිරීම |

11–951/2

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට සැම්ණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ශෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි